# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023 ඔක්තෝබර් 20 |

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) දූත කණ්ඩායමක් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙන් සහය දක්වන ආර්ථික ගැළපුම් වැඩසටහනේ පළමු සමාලෝචනය යටතේ 2023 වසරේ සැප්තැම්බර් 14 සිට සැප්තැම්බර් 27 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකා බලධාරීන් සමඟ සාකච්ඡා සිදු කළේය. ඉන් පසුවද සාකච්ඡා අඛණ්ඩව සිදුකළ අතර, ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩල කණ්ඩායම සහ බලධාරීන් විස්තීර්ණ ණය පහසුකමෙහි පළමු සමාලෝචනය අවසන් කිරීම සඳහා අවශ්‍ය ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධව කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට පැමිණියහ. දූත කණ්ඩායම විසින් මතු දැක්වෙන ප්‍රකාශය නිකුත් කරන ලද අතර එයට පහත සබැඳියෙන් ප්‍රවේශ විය හැකිය.

https://www.imf.org/en/News/Articles/2023/10/19/pr23357-sri-lanka-imf-reaches-sla-on-the-review-of-sri-lanka-extended-fund-facility-arrangement

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යමණ්ඩලය, ශ්‍රී ලංකාව සමඟ විස්තීර්ණ ණය පහසුකම් පිළිබඳව පළමු සමාලෝචනයට අදාළව නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹෙයි

යම් රටක සංචාරයකින් පසු හඳුනා ගන්නා මූලික සොයාගැනීම් පිළිබඳව ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩල කණ්ඩායම්වල ප්‍රකාශ දූත මෙහෙවර අවසානයේ නිකුත් කරන මාධ්‍ය නිවේදනයන්හි ඇතුළත් වේ. මෙම ප්‍රකාශයේ ප්‍රකාශිත අදහස් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යමණ්ඩලයේ අදහස් වන අතර ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අදහස් අවශ්‍යයෙන්ම නියෝජනය නොවේ. මෙම මෙහෙයුමේ මූලික සොයාගැනීම් මත පදනම්ව, කාර්යමණ්ඩලය විසින් කළමනාකාරීත්ව අනුමැතියට යටත්ව, සාකච්ඡා සහ තීරණ ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් සකස් කරනු ඇත.

- ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩලය සහ ශ්‍රී ලංකා බලධාරීන් මාස 48ක විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පළමු සමාලෝචනය අවසන් කරමින් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට පැමිණ ඇත. ජා.මූ. අරමුදලේ කළමනාකාරිත්වය සහ ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් සමාලෝචනය අනුමත කිරීමෙන් පසු ශ්‍රී ලංකාවට විදේශ ගැනුම් හිමිකම් (වි. ගැ. හි.) මිලියන 254ක (එ.ජ ඩොලර් මිලියන 330 ක් පමණ) මූල්‍යන පහසුකමක් සඳහා ප්‍රවේශය හිමිවෙනු ඇත.
- සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඵල දැරීමට පටන් ගෙන ඇති අතර ආර්ථිකය ස්ථාවර වීමේ තාවකාලික ලකුණු පෙන්නුම් කරයි. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව

තිරසාරව පවත්වා ගැනීම සහ පාලන දුර්වලතා සහ වංචා හා දූෂණ සඳහා විසඳුම් ලබාදීම, කල් පවත්නා ආර්ථික යථාතත්ත්වයට පත් වීමක් සහ ස්ථාවර මෙන්ම සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධන මාවතක් කරා ආර්ථිකය ගෙන ඒම සඳහා ඉතා වැදගත් වේ.

- ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් සමාලෝචනය සම්පූර්ණ කිරීම සඳහා *(i)* බලධාරීන් විසින් සියලුම පූර්ව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම; සහ *(ii)* මූල්‍ය සහතික සමාලෝචන අවසන් කිරීම අවශ්‍ය වේ.

**වොෂිංටන් - 2023 ඔක්තෝබර් 19:** කොළඹ දී සහ මරකේෂ් වාර්ෂික රැස්වීම් අතරතුර බලධාරීන් සමඟ පැවති ඵලදායී සාකච්ඡාවලින් අනතුරුව, ජා. මූ. අරමුදලෙහි ශ්‍රී ලංකාව සඳහා පත් කරන ලද ජ්‍යෙෂ්ඨ දූත මණ්ඩල ප්‍රධානී පීටර් බෲවර් මහතා සහ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී කට්සියරිනා ස්වර්යඩ්සෙන්කා මහත්මිය විසින් පහත ප්‍රකාශය නිකුත් කරන ලදී:

"මාස 48 ක විස්තීරණ අරමුදල් පහසුකම මගින් සහාය සැපයෙන ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ වන පළමු සමාලෝචනයේදී ජා. මූ. අරමුදලෙහි කණ්ඩායම ශ්‍රී ලංකා බලධාරීන් සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවකට එළැඹිණි. මෙම වැඩසටහන යටතේ ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා වි.ගැ.හි. බිලියන 2.3 (එ. ජ. බිලියන 3 ක් පමණ) සඳහා 2023 මාර්තු 20 වන දින අනුමත කරන ලදී.

"(i) සියලුම පූර්ව ක්‍රියාමාර්ග බලධාරීන් විසින් ක්‍රියාවට නැංවීම *(ii)* වැඩසටහනේ ණය ඉලක්කවලට අනුකූලව සහ කාලානුරූපීව ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් වනු ඇති බවට විශ්වාසයක් ඇති කෙරෙන පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීම ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා තිබේද යන්න තහවුරු කිරීම ඇතුළත් වන මූල්‍ය සහතික සමාලෝචන අවසන් කිරීම මත මෙම කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම සඳහා ඉදිරි කාල සීමාව තුළ ජා. මූ. අරමුදලෙහි කළමනාකාරිත්වය සහ එහි විධායක මණ්ඩලයේ අනුමැතිය හිමිවනු ඇත.

"ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය හිමිවීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාවට වි.ගැ.හි. මිලියන 254 (ඇමරිකානු ඩොලර් මිලියන 330 ක් පමණ) සඳහා ප්‍රවේශය ලැබෙනු ඇති අතර, ඒ අනුව මෙම පහසුකම යටතේ ජා.මූ. අරමුදල විසින් ශ්‍රී ලංකාවට ලබාදුන් සමස්ත අරමුදල් ප්‍රමාණය වි.ගැ.හි. මිලියන 508ක් (ඇමරිකානු ඩොලර් මිලියන 660 ක් පමණ) වනු ඇත.

"විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති ඉහළ අපේක්ෂා සහිත ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීම සඳහා බලධාරීන් කැපවී සිටින අතර, ශීඝ්‍ර නිරුද්ධමනයක් අත් කර ගැනීම සහ මේ වසර අවසන් වන විට රාජ්‍ය මූල්‍ය අංශයේ සිදු කිරීමට අපේක්ෂිත සැලකිය යුතු ගැළපීම් ද ඇතුළුව ඔවුන් විසින් සිදු කරන ප්‍රතිසංස්කරණ ප්‍රයත්න ප්‍රශංසනීයයි. හිඟ රාජ්‍ය වියදම් සම්බන්ධ නිර්ණායකය හැර, ජූනි අග සඳහා වූ සියලුම ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සපුරාලීමත් සමඟ ජූනි අවසානයේ වැඩසටහන් කාර්ය සාධනය සතුටුදායක විය. බදු ආදායම හැර අනෙකුත් සියලුම දර්ශක ඉලක්ක ද සපුරා ඇත. බොහෝ ව්‍යුහාත්මක මිණුම් දඬු නිසි කලට හෝ ප්‍රමාදයක් සහිතව හෝ 2023 සැප්තැම්බර් අග වන විට ක්‍රියාත්මක කර තිබේ.

විශේෂයෙන් ම, බලධාරීන් විසින් නිසි කලට <u>පාලන නිර්ණ වාර්තාව</u> ප්‍රකාශයට පත් කර ඇත. ජා.මූ.අ.හි පාලන නිර්ණයක් සිදුකළ පළමු ආසියානු රට ශ්‍රී ලංකාවයි. වැඩසටහන් පරාමිතිවලට අනුකූලව 2024 තුළ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමට සහාය වීම සඳහා ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග තවදුරටත් ක්‍රියාවට නැංවෙමින් පවතී.

"ආර්ථිකය ස්ථාවර වන බවට මූලික සලකුණු දක්නට ලැබේ. උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 70ක උපරිමයේ සිට 2023 සැප්තැම්බර් මාසය වන විට සියයට 1.3 දක්වා පහත වැටී ඇත. මේ වසරේ මාර්තු-ජූනි කාලය තුළ දී දළ ජාත්‍යන්තර සංචිත ඩොලර් බිලියන 1.5කින් ඉහළ ගොස් ඇති අතර අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල පැවති හිඟය අඩු වී ඇත. ස්ථාවරත්වයක් ඇති වන බවට මූලික සලකුණු දකින්නට ලැබුණත්, ආර්ථිකය සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් වනු ඇති බවට තවමත් නිශ්චිතව කිව නොහැක. දෙවන කාර්තුවේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.1කින් සංකෝචනය වෙමින් ආර්ථික වර්ධන වේගය පසුබෑමකට ලක් වී ඇති අතර, ඉහළ සංඛ්‍යාත ආර්ථික දර්ශක මගින් ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් මිශ්‍ර සංඥා ලබා දෙයි. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡාවලට දිගු කාලයක් ගතවීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ බාහිර අංශයේ තත්ත්වය දුර්වල වී ඇති අතර, මෑත මාසවල දී සංචිත ඉහළ නැංවීම මන්දගාමී වී ඇත. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට සහ විදේශ මූල්‍යන ලබා ගැනීමට බාධාවක් වන අවිනිශ්චිතතා ඉවත් කිරීම සඳහා ණය තිරසාර බව ප්‍රතිස්ථාපනය කිරීමට අනුකූල වන ලෙස ණය සඳහා සිදුකරන ප්‍රතිකර්ම පිළිබඳව කඩිනමින් එකඟතාවකට එළඹීම අත්‍යවශ්‍ය සාධකයක් වනු ඇත.

"ආර්ථිකය තිරසාරව යථා තත්ත්වයට පත්කිරීම මෙහෙයවීම සඳහා මෙන්ම ස්ථාවර හා සහභාගිත්ව ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ නැඹුරුතාව දිගටම පවත්වා ගැනීම අතිශය වැදගත් වේ. අවශ්‍ය බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ බදු පැහැර හැරීම් බැහැර කිරීම සඳහා සක්‍රීයව කටයුතු කිරීම මගින් වඩා හොඳ පාලනයක් ඇති කරන බවට සංඥා ලබා දීමටත් රාජ්‍ය ආදායම ඉහළ නැංවීමටත් බලධාරීන්ගේ ඇති කැපවීම අපි අගය කරමු. ඉන්ධන සහ විදුලි මිල ගණන් පිරිවැය ප්‍රතිසාධන මට්ටමක පවත්වා ගැනීම රජය සතු ව්‍යවසායයන්ගෙන් පැන නගින මූල්‍ය අවදානම් අවම කිරීමට උපකාරී වේ. දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් සහ අවදානමට ලක්වූවන් ආරක්ෂා කිරීම සඳහා සමාජ ආරක්ෂණ ජාලය තවදුරටත් ශක්තිමත් කිරීම ඉතා වැදගත් වේ. අපේක්ෂා කළ තත්ත්වයට වඩා වැඩි වේගයකින් උද්ධමනය අඩු වී ඇති අතර, උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට සහ සාර්ව ආර්ථික ස්ථායීතාවයට සහාය වීම සඳහා ඒ පිළිබඳව අඛණ්ඩව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. විදේශ අංශයේ අවිනිශ්චිතතා දිගින් දිගට ම පවතින පසුබිමක, වේගවත්ව සංචිත රැස් කිරීම හරහා බාහිර ස්වාරක්ෂක නැවත ගොඩනැගීම වැදගත් වේ.

"දේශීය ණය සම්බන්ධයෙන් බලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද වැඩපිළිවෙලින් අනතුරුව, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් අනුමත කරන ලද වැඩසටහනෙහි පරාමිතීන් සහ ණය ඉලක්කවලට අනුකූලව ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළව නිල ණය හිමියන් සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම මීළඟ තීරණාත්මක පියවර වේ. ශ්‍රී ලංකාව සහ චීනයේ අපනයන-ආනයන බැංකුව අතර ඇති තාවකාලික එකඟතාවක් පිළිබඳව අප විසින් අවධානය යොමු කර

ඇති අතර, ඉදිරියේදී ඒ සම්බන්ධ තොරතුරු ලැබුණු පසු එම තොරතුරු විශ්ලේෂණය කිරීමට බලාපොරොත්තු වෙමු. සියලුම නිල ණය හිමියන් ඔවුන් සපයන ලද මූල්‍ය සහතිකවලට අනුකූලව සුදුසු ණය ප්‍රතිකර්ම සිදු කිරීමට එකඟ වන ලෙස අපි නිල ණය හිමියන්ගෙන් ඉල්ලා සිටිමු. වාණිජ ණය හිමියන් සහ ශ්‍රී ලංකාව අතර මේ වන විටත් සාකච්ඡා සිදුවෙමින් පවතින බව අප දන්නා අතර ශක්තිමත් ලෙස ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අවශ්‍යතාවය ද අවධාරණය කර සිටිමු. එම ක්‍රියාවලිය පමා වීමේ අවදානම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉදිරි දැක්ම නරක අතට හැරවීම, රාජ්‍ය මූල්‍යනය පරතරය පුළුල් වීම, තිරසාර වර්ධනයට යළි ප්‍රවේශ වීමට බාධා ඇතිවනු ඇති අතර, එමගින් ණය ආපසු ගෙවීමේ හැකියාව අඩුවනු ඇත.

"මෑතක දී ප්‍රකාශයට පත් කරන ලද "පාලන නිර්ණ වාර්තාව" ප්‍රධාන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට බලධාරීන්ගේ කැපවීම මෙහි දී ඉතා වැදගත් පියවරකි. ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි ගොඩනැගීමට සහ වඩාත් ශක්තිමත් සහ සහභාගිත්ව ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා දූෂණය සම්බන්ධ අවදානම් කෙරෙහි පිළියම් යෙදීමට සහ වගකීම් සහගත බව ශක්තිමත් කිරීම සඳහා ස්ථිරසාර පියවර අත්‍යවශ්‍ය වේ.

"ජා.මූ. අරමුදලේ කණ්ඩායම විසින් ජනාධිපති හා මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ, රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ, භාණ්ඩාගාර ලේකම් කේ. එම්. මහින්ද සිරිවර්ධන සහ රජයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් ඉහළ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වන ලදී. ජා.මූ. අරමුදලේ කණ්ඩායම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පෞද්ගලික අංශයේ නියෝජිතයන්, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් ද හමු විය.

"ශ්‍රී ලංකා බලධාරීන් විසින් දක්වන ලද ඉහළ මට්ටමේ සහයෝගීතාවය සහ ඵලදායී සාකච්ඡා සඳහා කණ්ඩායමේ ස්තූතිය පළ කිරීමට කැමැත්තෙමු."